## මහජන ආරක්ෂක අමාත්‍යාංශය
## පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව

### දැන්වීමයි

### පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව විසින් ජාතික හැඳුනුම්පත් නිකුත් කිරීමේදී අය කරනු ලබන ගාස්තු සහ සේවාවන් සැපයීමේ දී අය කරනු ලබන ගාස්තු සංශෝධනය කිරීම.

2022.09.22 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේ දී ගනු ලැබූ තීරණ ප්‍රකාරව **2022.11.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි** පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව විසින් පහත උපලේඛනයේ සඳහන් කාර්යයන් සඳහා අය කරනු ලබන ගාස්තු ඒ ඒ කාර්යයට ඉදිරියෙන් දක්වා ඇති ප්‍රමාණයන්ට අනුකූල වන පරිදි සංශෝධනය කරනු ලබන බව මෙයින් දැනුම් දෙමි.

වියානි ගුණතිලක
පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ කොමසාරිස් ජනරාල්
පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව
10 වන මහල, සුහුරුපාය, ශ්‍රී සුභූතිපුර පාර, බත්තරමුල්ල.

### උපලේඛනය

| කාර්යය | ගාස්තුව |
|---|---|
| 1. මුල් වරට ලියාපදිංචි කර ජාතික හැඳුනුම්පතක් නිකුත් කිරීම සඳහා | රු. 200/- |
| 2. ජාතික හැඳුනුම්පතක සංශෝධිත පිටපතක් නිකුත් කිරීම සඳහා | රු. 500/- |
| 3. නැති වූ ජාතික හැඳුනුම්පතක අනු පිටපතක් නිකුත් කිරීම සඳහා | රු. 1,000/- |
| 4. වලංගු කාලය ඉකුත් වූ ජාතික හැඳුනුම්පතක් වෙනුවට නව ජාතික හැඳුනුම්පතක් නිකුත් කිරීම සඳහා (විද්‍යුත් ජාතික හැඳුනුම්පත් නිකුත් කිරීම ආරම්භ කිරීමෙන් පසු) | රු. 200/- |
| 5. එක් දින සේවය මගින් ජාතික හැඳුනුම්පතක් නිකුත් කිරීම සඳහා (අයඳුම්පත් ගාස්තුවට අමතරව) | රු. 2,000/- |
| 6. ජාතික හැඳුනුම්පත ඉංග්‍රීසි භාෂාවට පරිවර්තනය කිරීම සඳහා | රු. 2,000/- |
| 7. ජාතික හැඳුනුම්පතක තොරතුරු තහවුරු කිරීම, | |
| i) ශ්‍රී ලංකාවේ පිහිටි බැංකු, මූල්‍ය ආයතන, රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල, රජයට පවරාගත් ආයතන හෝ යම් ලිඛිත නීතියක් යටතේ ශ්‍රී ලංකාව තුළ පිහිටවනු ලැබූ ආයතනවල ඉල්ලීම මත සිදු කිරීම සඳහා | රු. 500/- |
| ii) පුද්ගලික ඉල්ලීම් මත සිදු කිරීම සඳහා | රු. 1,000/- |
| 8.ඡායාරූපාගාර ලියාපදිංචි කිරීම සඳහා | රු. 15,000/- |
| 9.ඡායාරූපාගාර ලියාපදිංචිය අළුත් කිරීම සඳහා (වසර දෙකකට වරක්) | රු. 3,000/- |